# ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය

## රියදුරු/කොන්දොස්තර (කාන්තා/පිරිමි) තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

**යහපත්, ගුණාත්මක ප්‍රවාහන සේවයක සාඩම්බර කොටස්කරුවෙකු වීම සඳහා අප හා එක්වන්න.**

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, දිවයින පුරා විසිරී පවතින ඩිපෝ 107ක් හා ඊට සම්බන්ධිත ප්‍රාදේශීය වැඩපලවල්, රියදුරු පාසල් වලින් සමන්විත, 25000කට වැඩි සේවක සංඛ්‍යාවක් සේවය කරන රාජ්‍ය මගී ප්‍රවාහන ආයතනයක් වන අප ආයතනයේ සියලුම ප්‍රාදේශිකයන්ට අයත් ඩිපෝවන්හි පුරප්පාඩු පවතින රියදුරු හා කොන්දෙස්තර තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට පහත සුදුසුකම්ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**පුරප්පාඩුව පවතින තනතුරු**

| තනතුර | පිරිමි | කාන්තා |
|---|---|---|
| රියදුරු | 425 | 25 |
| කොන්දොස්තර | 275 | 25 |

### 01. රියදුරු තනතුර (කොන්ත්‍රාත්)

**අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

i. අ.පො.ස. (සා/පෙළ) විභාගය විෂයයන් 06 ක් සම්මාන සාමාර්ථ 02 ක් සමග සමත්වීම. (දෙවරකට නොවැඩි වාර ගණනකදී)
ii. වයස අවුරුදු 21-45 අතර වීම.
iii. අවුරුදු 03 කට වැඩි වලංගු බරවාහන බලපත්‍රයක් සතුවීම.
iv. අවම බර කි.ග්‍රෑ. 45 ක් වීම.
v. උස අඩි 5
vi. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම.
vii. පිළිගත් ආයතනයක බරවාහන (මගී ප්‍රවාහන විශේෂයි) රියදුරෙකු වශයෙන් ලබා ඇති පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

### 02. කොන්දොස්තර තනතුර (කොන්ත්‍රාත්)

**අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්**

i. අ.පො.ස. (සා/පෙළ) විභාගය ගණිතය හා මව් භාෂාව ඇතුළුව විෂයයන් 06 ක් සම්මාන සාමාර්ථ 02 ක් සමග සමත්වීම. (දෙවරකට නොවැඩි වාර ගණනකදී)
ii. වයස අවුරුදු 18-45 අතර වීම.
iii. අවම බර කි.ග්‍රෑ. 41 ක් වීම.
iv. උස අඩි 5
v. මනා සෞඛ්‍ය තත්ත්වයකින් හෙබිවීම.
vi. කොන්දෙස්තර මගී ප්‍රවාහන බලපත්‍රයක් සතුවීම විශේෂ සුදුසුකමකි.

**පොදු කොන්දේසි හා ලබාදෙනු ලබන පහසුකම්**

- සේවක අර්ථසාධක අරමුදල සඳහා සේවකයාගේ දායකත්වය 08% වන අතර සේව්‍යයා විසින් 12% ක්ද දායකත්වය දරණු ඇත. සේවක භාරකාර අරමුදල සඳහා සේව්‍යයා විසින් 03% ක දායකත්වයක් ලබාදේ.
- මාසිකව මූලික කොන්ත්‍රාත් දීමනාව

  රියදුරු - රු. 38,387/-

  කොන්දොස්තර - රු. 37,715/-

රියදුරු හා කොන්දෙස්තර තනතුරු සඳහා ඉහත මූලික කොන්ත්‍රාත් දීමනාවට අමතරව

- ➢ ජීවන අංක දීමනාව රු. 17,800/-
- ➢ අතිකාල දීමනා
- ➢ දිරි දීමනා

ගෙවනු ලැබේ.

- බඳවා ගැනීමෙන් පසුව කාර්ය චක්‍ර පදනම මත සේවයේ යෙදවේ.
- රියදුරු තනතුරු සඳහා බඳවා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් පසුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් හා ශ්‍රීලංගම විසින් ලබා දෙනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රතිඵල අනුව මණ්ඩලීය පිළිවෙත් මත සිදු කෙරේ.
- කොන්දෙස්තර තනතුරු සඳහා බඳවා ගැනීම සම්මුඛ පරීක්ෂණයකින් පසුව ශ්‍රීලංගම විසින් ලබා දෙනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ප්‍රතිඵල අනුව මණ්ඩලීය පිළිවෙත් මත සිදු කෙරේ.
- බඳවා ගැනීමෙන් පසුව සේවා ස්ථානය සඳහා යාමට හා ඒමට කිලෝ මීටර් 30ක් ඇතුළත ගමන් අවසර පත්‍රයක් ලබා දෙනු ලැබේ.

ඉහත තනතුර සඳහා අයදුම් කිරීමට කැමති අයදුම්කරුවන් පහත සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පතක් "**ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2025-07-31 දිනට පෙර ලැබෙන ලෙස එවිය යුතුය. ලිපිය බහාලන කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි තමන් අයදුම් කරන තනතුර හා පළාත සඳහන් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේදී පාසල් හැරයාමේ සහතිකය (ශිෂ්‍ය කාර්ය දර්ශනය) හා අධ්‍යාපන සහතිකවල මුල් පිටපත් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුවේ. ආකෘති පත්‍රයට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවනු ඇත.

**ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,**
**අංක 200, කිරුළ පාර,**
**නාරාහේන්පිට, කොළඹ 05.**

---

**අයදුම් කරන තනතුර ..............................**

**කාන්තා** ☐ **පිරිමි** ☐

1. (අ) අයදුම්කරුගේ සම්පූර්ණ නම: ..............................
..............................

(ආ) මුලකුරු සමග නම :- ..............................
..............................

2. ලිපිනය :- ..............................
3. i උපන් දිනය :- ..............................

ii 2025-07-31 දිනට වයස:

අවුරුදු ......... මාස ......... දින .........

4. ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................
5. ආගම :- ..............................
6. ජාතිය :- ..............................
7. i ඔබ ශ්‍රීලාංකික පුරවැසියෙක්ද යන වග :- ..............

ii එසේ නම් ලියා පදිංචියෙන්ද පරම්පරාවෙන්ද යන වග:- ..............................

8. පළාත :- .............. දිස්ත්‍රික්කය:- ..............

ආසන්නතම ශ්‍රීලංගම බස් ඩිපෝව : ..............................

9. අධ්‍යාපන සුදුසුකම්

i අ.පො.ස. (සා/පෙළ)
වර්ෂය : ..............................

විභාග අංකය : ..............................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

අ.පො.ස. (උ/පෙළ)

වර්ෂය : ..............................

විභාග අංකය : ..............................

| | විෂයය | සාමාර්ථය |
|---|---|---|
| | | |

10. බර (කිලෝ) :- ..............................
11. උස අඩි :- .............. අඟල්:- ..............
12. දුරකථන අංකය නිවස:- .............. ජංගම:- ..............
13. i රියදුරු බලපත්‍ර අංකය (අදාලවේ නම් පමණි) :- ......
..............................

ii බලපත්‍ර කාණ්ඩය :- ..............................

iii වලංගු කාලය :- ..............................

14. i කොන්දෙස්තර බලපත්‍ර අංකය (අදාලවේ නම් පමණි):-
..............................

ii නිකුත් කළ ආයතනය :- ..............................

15. i මීට ඉහතදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කර ඇත්ද?:- ..............................
..............................

ii එසේනම් සේවය අවසන් වීම පිළිබඳ තොරතුරු සවිස්තරව සඳහන් කරන්න.
..............................

16 i මීට ඉහතදී උසාවියකින් ඔබ වරදකරු වී තිබේද?
:- ..............................

ii එසේනම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න:-
..............................

ඉහත සඳහන් විස්තර මාගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික වන අතර අසත්‍ය තොරතුරක් සැපයුවහොත් ඒ සම්බන්ධව මණ්ඩලය ගනු ලබන ඕනෑම තීරණයකට එකඟ වන බවද සහතික වෙමි.

දිනය : .............................. ..............................

අයදුම්කරුගේ අත්සන